මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

236, ගාලු පාර, කොළඹ 03.

0112 10 10 10 www.mi.com.lk

සමාගම් ලියාපදිංචි අංකය: PB 76 PQ

මෙම විගණන වාර්තාව අර්නස්ට් ඇන්ඩ් යංගේ විගණන ආයතනය විසින් අත්සන් කරන ලද ඉංග්‍රීසි විගණන වාර්තාවේ සිංහල පරිවර්තනයකි, පරිවර්තන අනුවාදයන් අතර අනුකූලතාවයක් ඇති නොවුනහොත් එවිට ඉංග්‍රීසි අනුවාදය සෑම විටම බලපවත්වනු ඇත.

EY
Shape the future
with confidence

Ernst & Young
Chartered Accountants
Rotunda Towers
No. 109, Galle Road
P.O. Box 101
Colombo 03, Sri Lanka

Tel : +94 11 246 3500
Fax : +94 11 768 7869
Email: eysl@lk.ey.com
ey.com

UM/TJCD/DM

ස්වාධීන විගණන වාර්තාව

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සි හි කොටස් හිමියන් වෙත
මූල්‍ය ප්‍රකාශනවල විගණනය පිළිබඳ වාර්තාව

මතය

මෙම වාර්තාවේ අඩංගු මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ("සමාගම") හි අප විසින් විගණනය කර ඇති අතර එහිදී ආයතනයේ 2026 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශනයන් ට සම්බන්ධ සටහන් අනුකූලව ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළුව සටහන් කර ඇති

අපගේ මතය අනුව මේ සමගින් ඇති මූල්‍ය ප්‍රකාශන, මේ වසරේ 2026 මාර්තු 31 වැනි දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙයි

අපගේ මතය සඳහා පදනම

අප අපගේ විගණනයන් ශ්‍රී ලංකාවේ විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදුකර ඇත. මෙම ප්‍රමිතීන්ට අනුකූලව අපගේ වගකීම්, එම විගණන ප්‍රමිතීන්ට අනුකූලව අපගේ වගකීම් පිළිබඳව තවදුරටත් සවිස්තරාත්මකව විගණනකරුගේ වගකීම යන කොටසේ දක්වා ඇත. අප ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද වෘත්තිය ගණකාධිකාරීවරුන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහයට අනුකූල ස්වාධීන ආයතනයක් වන අතර අප අපගේ අනෙකුත් සදාචාරාත්මක වගකීම් මෙම ආචාරධර්ම වලට අනුකූලව සම්පූර්ණ කර ඇත. අප ලබාගෙන ඇති විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත බව අපි විශ්වාස කරමු

මූලික විගණන කරුණු

මූලික විගණන කරුණු වන්නේ පවත්නා කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය තුළ වඩාත් සැලකිල්ලට ගනු ලැබූ කරුණු වේ. මෙම කරුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයේ අන්තර්ගතය තුළ ආමන්ත්‍රණය කරන ලද අතර ඒ සම්බන්ධව විගණකවරයාගේ විගණන මතය සකස් කිරීම තුළ මෙම කරුණු සම්බන්ධයෙන් වෙනම මතයක් අප සපයන්නේ නැත. පහත සෑම කරුණක්ම අපගේ විගණනයේදී සැලකිල්ලට ගත් ආකාරය පිළිබඳ විස්තරය පහත වගුවෙහි දක්වා ඇත.

මෙම කරුණු ඇතුළුව අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සඳහා විගණකගේ වගකීම් තුළ විස්තර කර ඇති වගකීම් අපි ඉටු කර ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන වල කරුණු අවප්‍රකාශය වීමේ අවදානම් පිළිබඳ අපගේ තක්සේරුවට ප්‍රතිචාර දැක්වීමට සැලසුම්කළ ක්‍රියාපටිපාටිවල කාර්ය සාධනය අපගේ විගණනයට ඇතුළත්ය. පහත කරුණු ආමන්ත්‍රණය කිරීමට ඉටුකරන ලද ක්‍රියාපටිපාටි ඇතුළුව අපගේ විගණන ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණන මතය සඳහා පදනම ලබා දේ.

ප්‍රධාන විගණන කරුණු

ණය හා ලැබිය යුතු කල්බදු සඳහා අපේක්ෂිත ණය අලාභ ප්‍රතිපාදන

ණය සහ ලැබිය යුතු කල්බදු වල අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන, පිළිවෙලින් 23 සහ 24 සටහන් හි දක්වා ඇති පරිදි ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන අතර, මූල්‍ය ප්‍රකාශනවල 3.2 සටහන් හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මත පදනම් ව කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ.

ණය සහ ලැබිය යුතු කල්බදු වල අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන, පිළිවෙලින් 23 සහ 24 සටහන් හි දක්වා ඇති පරිදි ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන අතර, මූල්‍ය ප්‍රකාශනවල 3.2 සටහන් හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මත පදනම් ව කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ.

- පහත හේතු නිසා මෙය ප්‍රධාන විගණන කරුණක් විය
- .ණය හා ලැබිය යුතු කල්බදු ප්‍රතිසාධනය සඳහා අනාගත මුදල් ප්‍රවාහය නිමානය කිරීමේදී සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයන් සම්බන්ධ මැදිහත්වීම සහ
- අපේක්ෂිත ණය අලාභ සඳහා වාර්තා කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රමාණාත්මකභාවය.

ණය සහ ලැබිය යුතු කල්බදු සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා වන ප්‍රතිපාදන තක්සේරු කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරන ලද සැලකිය යුතු විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු වල ප්‍රධාන ක්ෂේත්‍ර අතරට ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී ඇත්දැයි තීරණය කිරීම, ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික යෙදවුම් පුළුල් පරාසයක් භාවිතා කිරීම සහ ඒවාට අදාළ බර තැබීම් ඇතුළත් වන අතර ඒවා ආවේණිකවම ඉහළ යන ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයේ සහ මතභේදාත්මක විශ්ලේෂණයන්ට යටත් වේ.

ප්‍රධාන ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චය පිළිබඳ වැඩිදුර තොරතුරු 2.11 සටහන් වල අනාවරණය කර ඇත.

අපගේ විගණනයේ ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කළ ආකාරය

ණය සහ ලැබිය යුතු කල්බදු වල අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන ආමන්ත්‍රණය කිරීමේදී, අපගේ විගණන ක්‍රියාපටිපාටිවලට පහත මූලික ක්‍රියාපටිපාටි ඇතුළත් වේ.

- අපගේ වාර්තා දිනය දක්වා ලබාගත හැකි මනා තොරතුරු මත පදනම්ව අපේක්ෂිතණය අලාභ ප්‍රතිපාදන ගණනය කිරීම් සඳහා වූ සමාගමේ පවතින ක්‍රම වේදයන් සහ අදාල ගිණුම් කරණ ප්‍රතිපත්තිවල අනුකූලතාවය නක් ක්සේරු කරන ලදී.
- අපේක්ෂිත ණය අලාභ ප්‍රතිපාදන, ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය විසින් පවත්වාගෙන යනු ලබන අධීක්ෂණ, සමාලෝචන සහ අනුමැති ක්‍රියාවලීන්ගේ ප්‍රමාණවත්භාවය ඇගයීමට ලක් කළෙමු.
- සමාගමේ අදාළ මූලාශ්‍ර ලියවිලි සහ ගිණුම්කරණ වාර්තා සමඟ තොරතුරු ගළපා පරීක්ෂා කිරීම මගින් අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම තුළ භාවිතාකළ පාදක දත්තවල සම්පූර්ණත්වය, නිරවද්‍යතාව සහ සාධාරණත්වය පරීක්ෂා කරන ලදී.
- ණයවල තත්ත්වය පිළිබඳ තක්සේරු කිරීම් හා අදාළ අදියර වර්ගීකරණයන් සඳහා භාවිතා කරන ලද ගුණාත්මක හා ප්‍රමාණාත්මක සාධකවල සාධාරණත්වය ඇගයීමට ලක් කළෙමු.
- ඉහත කරුණු වලට අමතරව, පහත ක්‍රියා පටිපාටියන් සිදු කරන ලදී:

හානිකරණ සඳහා ඒකභාවී පදනමක් මත තක්සේරු කරන ලද ණය සහ ලැබිය යුතු කල්බදු සඳහා:

- අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනා ගණනය කිරීම වෙනුවෙන් භාවිතා කරන ලද ප්‍රධාන යෙදවුම් වල සාධාරණත්වය ඇගයීමට ලක් කරන ලදී. විශේෂයෙන්ම ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍ර වලට අදාළ මුදල් ප්‍රවාහ පුරෝකථනයන්හි වටිනාකම සහ කාල සීමාවන් මෙන්ම අයකර වල අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය සහ තත්ත්වය සැලකිල්ලට ගනිමින් මෙම ඇගයීම සිදු කරන ලදී.
- අන්තර්ගත ඒකභාවී හානිකරණ ගණනය කිරීම්වල ගණිතමය හා සම්බන්ධ නිරවද්‍යතාවය පරීක්ෂා කරන ලදී.

හානිකරණ සඳහා සාමූහික පදනමක් මත තක්සේරු කරන ලද ණය සහ ලැබිය යුතු කල්බදු සඳහා:

- අපේක්ෂිත ණය අලාභ හානිකරණ සඳහා භාවිතා කරන ලද ප්‍රධාන යෙදවුම් සහ ගණනය කිරීම් පරීක්ෂා කරන ලදී.
- කළමනාකරණය විසින් පාදක වූ ක්‍රමවේදය සහ කළමනාකරණ ආවරණ වලදී භාවිතා කරන විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු වල සාධාරණත්වය තක්සේරු කරන ලදී.
- අපගේ පරීක්ෂණයට, භාවිතා කරන ලද උපකල්පිත අනාගත සිදුවීම් වල සාධාරණත්වය ඇගයීම, සලකා බලන ලද සාර්ව-ආර්ථික ක්‍රියාදාම සහ එක් එක් අවස්ථාවට පවරා ඇති සම්භාවිතා බර තැබීම ඇතුළත් විය.
- මූල්‍ය ප්‍රකාශනවල 23,24,3.2 සහ 2.11 සටහන් හි දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන අනාවරණවල ප්‍රමාණතාව ඇගයීමට කරන ලදී.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධති ආශ්‍රිත අභ්‍යන්තර පාලනයන්

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, ස්වයංක්‍රීය ක්‍රියාවලීන් සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ගෙන් සමන්විත තොරතුරු තාක්ෂණ (IT) පද්ධති මත සැලකිය යුතු ලෙස විශ්වාසය තබා ඇත. තවද, ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන අනාවරණ තොරතුරු තාක්ෂණ පද්ධති මගින් උත්පාදිත දත්ත සහ වාර්තා භාවිතයෙන් පිළියෙල කරන අතර එය පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කෙරේ.

ඒ අනුව, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධති ආශ්‍රිත අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කාර්යයක් ලෙස සලකන ලදී.

අපගේ විගණන ක්‍රියාපටිපාටිවලට පහත මූලික ක්‍රියාපටිපාටි ඇතුළත් වේ.

- ක්‍රියාවලින් හී අභ්‍යන්තර පාලන වාතාවරණය පිළිබඳ අවබෝධයක් ලබා ගෙන මූල්‍ය වාර්තාකරණය සහ අදාළ ආනාවරණවලට අදාළ ප්‍රධාන පාලනයන් පරීක්ෂා කර ඇත.
- අපගේ අභ්‍යන්තර විශේෂිත සම්පත් සම්බන්ධ කර ගෙන ඇති අතර;
- පරිශීලක ප්‍රවේශය සහ කළමනාකරණ වෙනස්කම් සම්බන්ධව පාලන ඇතුළුව, මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති ආශ්‍රිත අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් හඳුනාගෙන, ඇගයීමට ලක් කර, ඒවායේ සැලසුම සහ ක්‍රියාකාරී ඵලදායීතාවය පරීක්ෂා කල අතර,
- සමාගමට බලපාන සයිබර් ආරක්ෂණ අවදානම් සහ මෙම අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මූලික වශයෙන් විමසීම් හරහා ඉහළ මට්ටමේ අවබෝධයක් ලබා ගැනීම.
- පොදු ලෙජර සැසඳීම් විස්තරය සමාලෝචනය කිරීම ඇතුළුව නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය සඳහා අනාවරණ උත්පාදනය කිරීමට භාවිතා කළ වාර්තාවල මූලාශ්‍ර දත්ත පරීක්ෂා කරන ලදී.

2026 සමාගමේ වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කර ඇති වෙනත් තොරතුරු

මූල්‍ය ප්‍රකාශන සහ එහි අපගේ විගණන වාර්තාව හැර වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් අනෙකුත් තොරතුරු ද සමන්විත වේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී. සමාගමේ 2026 වාර්ෂික වාර්තාව, මෙම විගණන වාර්තාවේ සඳහන් දිනයෙන් පසු අප හට ලබාදෙනු ඇති බව අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සහතික කරන අදහසක් අපි ප්‍රකාශ නොකරමු.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණනය සම්බන්ධයෙන්, අපගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබාගැනීමට හැකි අවස්ථාවේදී එම තොරතුරු කියවීම වන අතර, එසේ කරමින් අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකියයුතු ලෙස නොගැලපේද යන්න සහ විගණනය තුළ හෝ වෙනත් ආකාරයකින් ලබාගත් අපගේ දැනුම සැලකියයුතු ලෙස වැරදියට සඳහන් කර ඇති බව පෙන්නුම් කරන්නේද යන්න සලකා බැලීමයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරීත්වයේ සහ පාලනයට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ වංචා හෝ දෝෂ හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවලින් තොර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අවශ්‍ය යැයි කළමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනය සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව තක්සේරු කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමුහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, පාලනයට සම්බන්ධ පාර්ශ්වයන්ගේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ අපගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම අපගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම, උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක කොටසක් ලෙස, අපි විසින් විගණනය තුළ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තීය සැක මුසු බව පවත්වා ගනු ලැබීය. තවද අපි,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගෙන හා තක්සේරු කර, එම අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විගණන පටිපාටි සැලසුම් කර ඉටු කරමින් අපගේ විගණනය සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගතිමු. වංචාවකින් ඇතිවන වැදගත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සොයා නොගැනීමේ අවදානම දෝෂයෙන් සිදුවන බලපෑමට වඩා ඉහළ වන අතර, වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, වංචාව දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යෑම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරමු.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීමට ලක් කළෙමු.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම කළමනාකරණය විසින් යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට අපි නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට අපගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් අපගේ මතය විකරණය කළ යුතුය. අපගේ නිගමනයන් අපගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර මූල්‍ය ප්‍රකාශන එයට පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් සාධාරණ ඉදිරිපත් කිරීම සාක්ෂාත් කර ගන්නා ආකාරයෙන් නියෝජනය කරන්නේද යන්න අගයන ලදී.

අපගේ විගණනය තුළ වෙනත් කරුණු අතර අප හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකියයුතු දුර්වලතා ඇතුළුව, විගණනයේ සැලසුම්ගත විෂයපථය සහ කාලසීමාව සහ සැලකියයුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් අපි පාලනයට සම්බන්ධ වගකීම් දරණ පාර්ශ්වයන් සමඟ සන්නිවේදනය කරන්නෙමු.

අපි ස්වාධීනත්වය සම්බන්ධ අදාළ ආචාරධර්ම අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇති බවට සහ අපගේ ස්වාධීනත්වය මත සාධාරණ ලෙස සිතිය හැකි සියලු සබඳතා සහ වෙනත් කරුණු ඔවුන් සමඟ සන්නිවේදනය කිරීමට සහ අදාළ අවස්ථාවලදී තර්ජන ඉවත් කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග හෝ යොදාගත් ආරක්ෂාවන් පිළිබඳ ප්‍රකාශයක් පාලනය සම්බන්ධයෙන් වගකීමට බැඳී ඇති අයට ලබා දෙන්නෙමු.

අධීක්ෂණය භාරව සිටින පාර්ශව සමග සන්නිවේදනය කරන ලද කරුණු අතරින් වත්මන් කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේ දී වඩාත් වැදගත් වූ කරුණු බව අප විසින් තීරණය කරනු ලබන අතර ඒවා ප්‍රධාන විගණන කරුණු ලෙස සැලකේ. නීතිය හෝ නියාමන මගින් එම කරුණු ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම වළක්වා ඇති අවස්ථාවන්හිදී හෝ අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී එම කරුණු සංවේදනය කිරීමෙන් ඇතිවිය හැකි අහිතකර බලපෑම් මහජන අවශ්‍යතා ප්‍රතිලාභ ඉක්මවා යනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කරන විට හැර අපගේ විගණක වාර්තාවේ එම කරුණු විස්තර කරනු ලැබේ.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය අනුව, විගණනය සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු මෙන්ම පැහැදිලි කිරීම් අපි ලබා ගත් අතර, අපගේ පරීක්ෂණයෙන් පෙනෙන පරිදි, විධිමත් ගිණුම්කරණ වාර්තා සමාගම විසින් තබා ගෙන ඇත.

මෙම ස්වාධීන විගණකගේ වාර්තාව අත්සන් කිරීම සඳහා වගකිව යුතු ගිවිසුම්ගත හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්ව අංකය 8913 වේ.

(අත්සන් කළේ)
අර්නස්ට් ඇන්ඩ් යංගේ
2026 ජූනි 24
කොළඹ

Partners: D K Hulangamuwa FCA FCMA LLB (London), Ms. Y A De Silva FCA, Ms. G G S Manatunga FCA, W K B S P Fernando FCA FCMA FCCA, B E Wijesuriya FCA FCMA, R N de Saram ACA FCMA, N M Sulaiman FCA FCMA, Ms. L K H L Fonseka FCA, Ms. P V K N Sajeewani FCA, A A J R Perera FCA ACMA, N Y R L Fernando ACA, D N Gamage FCA ACMA, C A Yalagala ACA ACMA, Ms. P S Paranavitane ACA ACMA LLB (Colombo), B Vasanthan ACA ACMA, W D P L Perera ACA, M U M Mansoor ACA

Principals: T P M Ruberu FCMA FCCA MBA, G B Goudian ACMA, D L B Karunathilaka ACMA, W S J De Silva Bsc (Hons) - MIS Msc - IT, V Shakthivel B.Com (Sp)

A member firm of Ernst & Young Global Limited

ලාභ හා අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය (විගණනය කළ)

මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	2026 (රු. '000)	2025 (රු. '000)
දළ ආදායම	16,610,726	11,708,896
පොලී ආදායම	15,832,103	10,998,708
පොලී වියදම	(7,855,428)	(5,206,139)
ශුද්ධ පොලී ආදායම	7,976,675	5,792,568
ගාස්තු සහ කොමිස් ආදායම	666,329	530,236
ගාස්තු සහ කොමිස් වියදම	(21,214)	(21,238)
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	645,114	508,998
වෙනත් මෙහෙයුම් ආදායම	112,293	179,952
මුළු මෙහෙයුම් ආදායම	8,734,083	6,481,518
ණය සහ වෙනත් හානිකරන ගාස්තු	(475,898)	(224,648)
ශුද්ධ මෙහෙයුම් ආදායම	8,258,185	6,256,871
අඩු කළා: මෙහෙයුම් වියදම්		
පුද්ගල පිරිවැය	(2,659,751)	(2,093,207)
දේපල පිරියතට හා උපකරණ,භාවිතයට ඇති අයිතිය ක්ෂය කිරීම සහ අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	(334,994)	(255,511)
වෙනත් මෙහෙයුම් වියදම්	(2,286,799)	(1,762,464)
මුළු මෙහෙයුම් වියදම්	(5,281,544)	(4,111,181)
බදු පෙර මෙහෙයුම් ලාභය	2,976,641	2,145,689
බදු අඩු කළා:	(1,059,410)	(737,622)
බදු පසු මෙහෙයුම් ලාභය	1,917,231	1,408,066
එකතු කළා: ආශ්‍රිත සමාගම්වල ලාභය	212,050	199,266
බදු පැනවීමට පෙර මෙහෙයුම් වලින් ලාභය	2,129,281	1,607,332
අඩු කළා: ආදායම් බදු වියදම්	(980,716)	(532,665)
වසර සඳහා ලාභය	**1,148,565**	**1,074,666**
වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්)		
අදාළ කාලයෙන් පසු ලාභයට සහ අලාභයට ප්‍රතිවර්ගීකරණය කළ යුතු අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)		
වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය වත්කම් වල සාධාරණ අගයෙහි වෙනස්වීම	(6,848)	(8,600)
අදාළ කාලයෙන් පසු ලාභයට සහ අලාභයට ප්‍රතිවර්ගීකරණය කළ යුතු අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)	**(6,848)**	**(8,600)**
අදාළ කාලයෙන් පසු ලාභයට සහ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකළ අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)		
අනෙකුත් විස්තීරණ ආදායම හරහා මූල්‍ය ආයෝජනවල සාධාරණ වටිනාකමේ වෙනස්වීම	440,257	630,994
ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන අතිරික්තයේ ශුද්ධ වෙනස	673,672	-
ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන අතිරික්තය සඳහා විලම්බිත බදු බලපෑම	(202,102)	-
ආශ්‍රිත සමාගම්වල වෙනත් විස්තීරණ ආදායමේ කොටස (ශුද්ධ බදු)	8,493	113,091
විශ්‍රාම පාරිතෝෂික වගකීම මත කාලගණන ලාභය/(අලාභය)	(48,159)	(65,004)
කාලගණන ලාභය මත විලම්බිත බදුවල බලපෑම	14,448	1,465
අදාළ කාලයෙන් පසු ලාභයට සහ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකළ ශුද්ධ අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)	**886,609**	**680,546**
වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්) (ශුද්ධ බදු)	**879,761**	**671,946**
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ බදු)	**2,028,326**	**1,746,612**
කොටසකට ඉපැයීම්		
සාමාන්‍ය කොටසකට මූලික ඉපැයීම් (රු.)	1.91	1.79
සාමාන්‍ය කොටසකට තනුක ඉපැයීම් (රු.)	1.91	1.79
සාමාන්‍ය කොටසකට ලාභාංශ (රු.)	0.25	0.13

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (විගණනය කළ)

	31-03-2026 (රු. '000)	නැවත ප්‍රකාශ කළ 31-03-2025 (රු. '000)	නැවත ප්‍රකාශ කළ 31-03-2024 (රු. '000)
වත්කම්			
මුදල් සහ මුදල් සමානතා	9,303,037	2,724,044	2,492,057
ක්‍රමක්ෂය පිරිවැයට බැංකු සමඟ කළ තැන්පතු	37,059	37,254	3,460
වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (ප්‍රකාශිත)	6,988,446	7,199,933	6,427,831
මූල්‍ය ආයෝජන - ලාභ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	349,833	344,772	329,519
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්	72,166,154	27,972,014	16,591,202
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - මූල්‍ය කල් බදු	29,710,908	25,260,543	20,302,868
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - කුලී සින්නක්කර	33,690	80,729	101,631
වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (අප්‍රකාශිත)	70,427	70,427	70,427
වෙනත් මූල්‍ය වත්කම්	311,007	284,228	289,256
තොගය	184,749	73,839	101,181
වෙනත් මූල්‍ය නොවන වත්කම්	271,399	222,488	179,494
ආශ්‍රිත සමාගම්වල ආයෝජනය	1,937,126	1,716,582	1,404,225
ආයෝජන වත්කම්	236,727	258,390	260,056
දේපල පිරියත සහ උපකරණ	5,427,668	4,512,330	4,391,241
පාවිච්චි කිරීමේ අයිතියට නතු වත්කම්	599,662	327,439	215,306
කල්බදු දේපල	37,929	38,397	38,866
අස්පෘශ්‍ය වත්කම්	68,044	51,167	32,094
මුළු වත්කම්	**127,733,865**	**71,174,574**	**53,230,714**
වගකීම්			
බැංකු අයිරාව	912,248	687,242	317,122
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම් - පාරිභෝගික තැන්පතු	62,011,916	42,775,086	36,104,935
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම් - ණය උපකරණ සහ වෙනත් ණය ගැනීම්	45,496,293	11,418,919	2,441,542
වෙනත් මූල්‍ය වගකීම්	938,265	590,886	430,673
වත්මන් බදු වගකීම්	532,858	194,269	236,812
විලම්බිත බදු වගකීම්	776,260	685,588	750,164
වෙනත් වගකීම්	212,962	94,972	114,914
විශ්‍රාම පාරිතෝෂික වගකීම්	586,182	489,083	396,405
කල් බදු වගකීම්	551,119	401,997	273,077
මුළු වගකීම්	**112,018,104**	**57,338,041**	**41,065,644**
කොටස් හිමියන්ගේ අරමුදල			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	36,000	36,000	36,000
ප්‍රත්‍යාගණන සංචිතය - ඉඩම් සහ ගොඩනැගිලි	2,667,796	2,208,767	2,221,256
ප්‍රත්‍යාගණන සංචිතය - ආශ්‍රිත සමාගම් සංචිතය	726,881	718,388	605,297
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	1,171,200	941,400	887,400
පොදු සංචිත	4,086,430	4,086,430	4,086,430
රඳවා ගත් ඉපැයුම්	6,108,661	4,900,249	3,180,353
නියාමන පාඩු දීමනා සංචිතය	-	336,894	1,067,522
OCI සංචිතය තුලින් සාධාරණ වටිනාකම	918,793	608,405	80,812
මුළු කොටස් හිමියන්ගේ අරමුදල්	**15,715,761**	**13,836,533**	**12,165,070**
මුළු වගකීම් සහ කොටස්කරුවන්ගේ අරමුදල්	**127,733,865**	**71,174,574**	**53,230,714**
කොටසකට ශුද්ධ වත්කම් (රු)	**26.14**	**23.01**	**20.23**

සහතික කිරීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මම සහතික කරමි.

දේවා ඇන්තනී
ප්‍රධාන මූල්‍ය නිළධාරී/අධ්‍යක්ෂ (මාණ්ඩලික නොවන)

මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරනු ලැබේ. එම අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

ජෙරාඩ් ජී. ඔන්ඩ්ජී — කළමනාකාර අධ්‍යක්ෂ
ෂර්මාල් එච්. ජයසූරිය — මූල්‍ය අධ්‍යක්ෂ

2026.06.24 කොළඹ.

ප්‍රධාන කාර්ය සාධන දර්ශක

අයිතමය	31.03.2026 දිනට		31.03.2025 දිනට	
නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය (%)	තථ්‍ය	අවශ්‍ය	තථ්‍ය	අවශ්‍ය
1 වන ස්ථරයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	10.69%	10.00%	15.59%	8.50%
සමස්ථ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	16.04%	14.00%	17.27%	12.50%
තැන්පතු වගකීම් අනුපාතය වෙත ප්‍රාග්ධන අරමුදල්	21.87%	10.00%	28.34%	10.00%
ණය කළඹේ ගුණාත්මකතාවය (%)				
දළ අදියර 3 ණය අනුපාතය		3.23%		4.91%
ශුද්ධ අදියර ණය අනුපාතය		1.57%		2.60%
ශුද්ධ අදියර 3 ණයට මූලික ප්‍රාග්ධන අනුපාතය		14.13%		14.11%
අදියර 3 වෙන්කිරීම් ආවරණ අනුපාතය		52.53%		48.67%
මුළු හානිකරණ ආවරණ අනුපාතය		2.32%		3.07%
ලාභදායීත්වය (%)				
ශුද්ධ පොලී ආන්තිකය		9.07%		11.10%
වත්කම් මත ප්‍රතිලාභය		2.14%		2.59%
හිමිකම් මත ප්‍රතිලාභය		7.77%		8.27%
ආදායම් මත පිරිවැය අනුපාතය		72.60%		75.61%
ද්‍රවශීලතාවය (%)				
අවශ්‍යතා ද්‍රවශීල වත්කම් සඳහා පවතින ද්‍රවශීල වත්කම් අනුපාතය (අවම 100%)		217.38%		197.68%
බාහිර අරමුදල් සඳහා ද්‍රවශීල වත්කම්		13.43%		15.57%
නාමික තොරතුරු				
ශාඛා ගණන		92		73
බාහිර ණය ශ්‍රේණිය		ෆිච් ශ්‍රේණිගත කිරීම Long-term Financial Institution Rating at BBB-(lka) (Stable outlook)		ෆිච් ශ්‍රේණිගත කිරීම Long-term Financial Institution Rating at BBB-(lka) (Stable outlook)

2026 මාර්තු 31 සහ 2025 මාර්තු 31 න් අවසන් වූ කාලසීමාව සඳහා නියාමන අධිකාරියක් විසින් තැන්පතු සීමා, ණය ගැනීම් සීමා හා ණය දීම් සීමා කිසිවක් සමාගමට අදාළව පනවා නොමැත.

සහතික කිරීම:

ප්‍රධාන මූල්‍ය නිලධාරී, මූල්‍ය අධ්‍යක්ෂ, කළමනාකාර අධ්‍යක්ෂ සහ අනුකූලතා නිලධාරී ලෙස අපි ඒකාබද්ධව අත්සන් කර ඇත.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති ආකෘතියට හා අර්ථ දැක්වීම්වලට අනුකූලව ඉහත ප්‍රකාශ සකස් කර ඇති බවත්,
(ආ) විගණනය කර ඇති බව දක්වා ඇත්නම් මිස, මෙම ප්‍රකාශවල අඩංගු තොරතුරු බලපත්‍රලාභී මූල්‍ය සමාගමේ විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගෙන ඇත.

දේවා ඇන්තනී — ප්‍රධාන මූල්‍ය නිලධාරී
ශ්‍යාමලී ජේමරත්න — අනුකූලතා නිලධාරී
ෂර්මාල් එච්. ජයසූරිය — මූල්‍ය අධ්‍යක්ෂ
ජෙරාඩ් ජී. ඔන්ඩ්ජී — කළමනාකාර අධ්‍යක්ෂ

Jebz